# 2017 සාධන පරීක්ෂණ අංක 02 4 ශ්‍රේණිය.

වලස්මුල්ල අධ්‍යාපන කලාපය.

01.කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

සිළි සිළි ගා සුළඟ හමන
කන්ද පහළ අඳුර මැවෙන
ලන්දෙ කුරුළු සිංදු මැකෙන
හැන්දෑ යාමේ....

1. සුළඟේ ශබ්දය කුමක්ද?

..........................................................................................................................................

2. කවියෙන් කියවෙන්නේ දවසේ කුමන වේලාවක් ගැනද?

..........................................................................................................................................

3. කවියේ සඳහන් කුරුල්ලන් සිටින්නේ කොහේද?

..........................................................................................................................................

4. දීර්ඝ ඇදය යෙදෙන වචනයක් සොයා ලියන්න.

..........................................................................................................................................

5. අඳු[රු] - කොටු කළ අකුරට යොදන ලද පිල්ලම කුමක්ද?

..........................................................................................................................................

6. විශේෂණ පදයක් කවියෙන් සොයා ලියන්න.

..........................................................................................................................................

7. ඉහළ" යන්නට විරුද්ධ පදය කුමක්ද?

..........................................................................................................................................

8. සඤ්ඤක අකුරු යෙදුනු වචනයක් කවියෙන් තෝරා ලියන්න.

..........................................................................................................................................

9. රෑ බෝ වී ගෙන යන්නෙහි අදහස දැක්වෙන කොටස කවියෙන් සොයා ලියන්න.

..........................................................................................................................................

10. පවන යන්නට සමාන පදයක් කවියේ සඳහන් වේ. එය කුමක්ද?

..........................................................................................................................................

(ල.1*10-10)

02. නිවැරැදි අක්ෂරය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

1. විශේ......... (ෂ , ශ) 2. පොකු......... (ණ , න) 3. ක........වැටිය (දු ,ඳු)

4. ඉ........මග (නි , ණි)　　　5. ඇ..........ල්ල (බි , ඹි)　　(ල.1*5-5)

03. සුදුසු විරාම ලක්ෂණ වරහන් තුළින් තෝරා ලියන්න.( , ! ? )

1. ඔබ එන්නේ කොහි සිටද

2. ඒත් පිනුම් අප්පු උඹ

3. මේ ඔයේ ඉවුර දෙපස උණ බට ඇඹිල්ල වැවී ඇත　　(ල.1*5-5)

04. පහත වැකි වල හිස්තැනට සුසු ක්‍රියාපදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

1. හාවාට හොඳටම කේන්ති .......　　(ගියේය, ගියෝය )

2. අපි වැඩිහිටියන්ට සැලකීමට පුරුදු......　　(වෙමි, වෙමු )

3. දෙදෙනා ම කැළැව මැදට ........ (පැමිණියේය, පැමිණියහ)

4. ගල්තලාවේ වාඩි වුණු තරිඳු වටපිට ...... (බැලුවේය, බැලුවාය)

5. හා බිරිඳ දරුවන් සමග තාත්තා එන තුරු මග බලා සිටින අයුරු ඔවුහු .....(දුටුවේය ,දුටුවෝය)　　(ල.2*5-10)

05. පෙළ පොත ඇසුරින්ම පිළිතුරු සපයන්න.

1. මාදම් (i)......................... පොකුරු පිටින්

(ii)...................................දැක අත වනයි.

2. කකුල් මහ පොළොවට .................................. මෙන් දැනෙන්නට විය.

3. කතාව ගමනට ................................ නොවැ.

4. ශ්‍රී ලංකාව අපේ ................................... යි.　　(ල.1*5-5)

06. පහත මාතෘකාව යටතේ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි වූ වාක්‍ය තුනක් ලියන්න. එක් එක් වාක්‍යයක වචන පහක් වත් තිබිය යුතුය.

මගේ රට

1.......................................................................................................................

2.......................................................................................................................

3.......................................................................................................................

(ල.2*3-6)

07. පහත දැක්වෙන සිදුවීමෙහි අනුපිළිවෙළ අනුව අංක යොදන්න.

1. ස්තුති කතාව　　......


2. ත්‍යාග ප්‍රදානය　　......

3. ආරාධිත අමුත්තන් පිළිගැනීම　　......

4. පිළිගැනීමේ කතාව .......

5 ප්‍රධාන ආරාධිතයින්ගේ කතාව ....... (ල.1*5-5)

08. පහත රූප වලට අදාල ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන්ම ලියන්න.


______________________


______________________

3. පහත ඉංග්‍රීසි වාක්‍යයේ සිංහල තේරුම ලියන්න.

Who is shouting

........................................................................................................ (ල.4)

09. පහත දෙමළ වාක්‍ය වල සිංහල තේරුම ලියන්න.

(1) 1.උංගල් වීට්ටු මුහවරි එන්න?

........................................................................................................

2. නාන් අප්පා

........................................................................................................


(2) පහත සදහන් වචන වලට ගැළපෙන වචනය සිංහල අකුරෙන් ලියන්න.

1. අල්මාරිය ............................................

2. සීයා ............................................

(ල.6)

10.පහත සදහන් ගණක රාමුවෙන් දැක්වෙන සංඛ්‍යාව කීයද?



............................................

2. එය අකුරෙන් ලියන්න. ............................................................

11. එක් බදුනක පලතුරු බීම 6l 750ml ක ප්‍රමාණයක් තිබුණි.තවත් බදුනක පලතුරු බීම 10l 450ml ක ප්‍රමාණයක් තිබුණි.බදුන් දෙකේම තිබුණු මුලු පලතුරු බීම ප්‍රමාණය කොපමණද?

........................................................................................................

12. පහත රවුම තුළ ඇති ඉලක්කම් සියල්ලම භාවිතා කර සෑදිය හැකි

| | |
|---|---|
| 8 | 0 |
| 3 | 9 |

1. විශාලම සංඛ්‍යාව කුමක්ද?

2. කුඩාම සංඛ්‍යාව කුමක්ද?

13. හිස්තැන් සම්පූර්ණ කරන්න.

7 1 3 5 ———— + 100 + 30 + 5

- එකස්ථානය.
- ..........................................................................
- සියස්ථානය
- දහයස්ථානය.

14. ළමා වේදිකා නාට්‍යයක් නැරඹීම සඳහා තෙදිනක් තුළ පැමිණි ප්‍රේක්ෂකයන් සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වල පිළිතුරු ලියන්න.

| දිනය | ගැහැනු ළමයි | පිරිමි ළමයි |
|---|---|---|
| සෙනසුරාදා | 265 | 302 |
| ඉරිදා | 408 | 286 |
| සඳුදා | 240 | 226 |

1. සෙනසුරාදා සහ ඉරිදා දින දෙකේ පැමිණි පිරිමි ළමයි සංඛ්‍යාව කොපමණද?

..........................................................................................................................................

2. සෙනසුරාදා පැමිණි ගැහැනු ළමයි හා පිරිමි ළමයි සංඛ්‍යාව කොපමණද?

..........................................................................................................................................

3. ඉරිදා සහ සඳුදා පැමිණි ගැහැනු ළමයින්ගේ එකතුව කීයද?

..........................................................................................................................................

15.



8kg 750g



13kg 850g

වට්ටක්කා ගෙඩියේ හා පරිප්පු බෑගයේ මුලු බර කොපමණද?

16. පහත සඳහන් සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට සැකසූ විට මැදට එන සංඛ්‍යාව කීයද?

605 , 366 , 729 , 423 , 561

..........................................................................................................

17. පහත සඳහන් ස්ථානීය අගය පෙතේ 3124 අදාළ සංඛ්‍යාංකය කොටු කරමින් නිරූපනය කරන්න.

| | | | |
|---|---|---|---|
| 4000 | 400 | 40 | 4 |
| 3000 | 300 | 30 | 3 |
| 2000 | 200 | 20 | 2 |
| 1000 | 100 | 10 | 1 |

18. 1-9 දක්වා ඉලක්කම් අතරින් එක ළඟ සංඛ්‍යා දෙකක එකතුව 11 වන සංඛ්‍යා පිළිවෙළින් ලියන්න.


.............................................................................................................................

19. පහත සඳහන් සංඛ්‍යා අතුරින් කිනම් සංඛ්‍යා දෙක එකතු කිරීමෙන් 959 ලැබේද?

457 624 207 335

.............................................................................................................................

20. දී ඇති ඝනකයේ විරුද්ධ මුහුණතේ ඇත්තේද එම පැහැය හා සංඛ්‍යාවම වේ. ඒ අනුව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.





1. කහ පැහැති මුහුණත්වල එකතුව කීයද ?

.............................................................................................................................

2. එකතුව 1230 වන්නේ කිනම් වර්ණයේ මුහුණත් වලද ?

.............................................................................................................................

21. පහත සඳහන් ගණක රාමුවල දක්වා ඇති සංඛ්‍යාවල එකතුව ගණක රාමුවේ දක්වන්න.




.............................................................................................................................

(ල.30)

නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

22. පෙති හතරක් ඇති මලක් වන්නේ

1)අරලිය 2)නා 3)ඉද්ද 4)මානෙල්

23. එරබදු මල ........ පාටයි.

1) රතු 2)කහ 3)රෝස 4)සුදු

24. ඵලයට පිටතින් බීජය පිහිටි ශාකය කුමක්ද ?

1)මුරුංගා 2)කජු 3)දෙලුම් 4)අඹ

25. කෑමට ගන්නා මල් වර්ගයකි.

1)පැපොල් 2)රණවරා 3)කෙසෙල් 4)අඹ

26. ශාකවල මුල් කා දමන සතෙක් වන්නේ

1)ගොළුබෙල්ලා 2)වදුරා 3)මී මැස්සා 4)වේයා

27. ශරීරය ඉතා උණුසුම් සතා වන්නේ

1)බල්ලා 2)පූසා 3)මී හරකා 4)හූනා

28. කැද සෑදීමට යොදා නොගන්නේ

1)හාතාවාරිය 2)එරමුසු 3)වට්ටක්කා 4)ගොටුකොළ

29. ක්ෂීරපායී සතෙකි

1)කුකුළා 2)මොනරා 3)වවුලා 4)ගිරවා

30. කැරපොත්තාගේ රුධිරයේ පැහැය වන්නේ

1)රතු 2)සුදු 3)නිල් 4)කහ

31. මහාමාරිය බෝ කරන සතා වන්නේ,

1)මදුරුවා 2)වදුරා 3)මීයා 4)ගෙමැස්සා

32. බීජ ව්‍යාප්තිය සිදු කරයි.

1)සමනලයා 2)වවුලා 3)බල්ලා 4)ගැඩවිලා

33. සර්ව භක්ෂක සතෙකු වන්නේ

1)මකුළුවා 2)බළලා 3)මුවා 4)ගවයා

34. ජලභීතිකාව බෝ කරන්නේ

1)මදුරුවාය 2)නරියා ය 3)මීයා ය 4)ගෙමැස්සාය

35. ඖෂධ ලබා දෙන සතෙකි.

1)බල්ලා 2)පූසා 3)කස්තුරි මුවා 4)ගිරවා

(ල.14)

02 පිළිතුරු පත්‍රය

01. 1)සිලි සිලි 2)හැන්දෑ යාමය 3)ලන්දෙ 4)හැන්දෑ 5)පා පිල්ල 6)කුරුලු

7)පහළ 8)අඳුර/ සුළඟ 9)අඳුර 10)සුළඟ

02. 1) ෂ 2) ණ 3) ඳු 4) ණ 5) ඕ

03. 1) . 2) ? 3) , . .

04. 1) ගියේය 2) වෙමු 3) පැමිණියහ 4) බැලුවේ ය 5) දුටුවෝ ය

05. 1) 1. ගෙඩි 2. ළමයින්

2) ඇලුනාක්

3) ඉණිමගක්

4) මාතෘභූමිය

06. නිර්නායක

නිවැරදි අක්ෂර විනයාසය, නිවැරදි උක්ත ආඛ්‍යාත සම්බන්ධය, වැකියට අදාළ වචන සංඛ්‍යාව, මානෂතාවට අදාළ බව, විරාම ලකුණු

07. (1) (2) (3) (4) (5)

08. (1) horse (2)moon (3) කවුද කෑගහන්නේ

09.1. ඔබේ ගෙදර ලිපිනය කුමක් ද? 2. මම තාත්තා

3. 1 අලුමාරි 2 පාට්ටන්

10. 1) 3042 2) තුන් දහස් හතලිස් දෙක

11. 17 200

12. 1) 9830 2) 3089

13. 1) 7000 2) දහයස්ථානය

14. 1) 814 2) 567 3) 648

15.22kg 600g

16.561


17. 3000 100 20 4

18.5,6

19.624+335

20. 1) 614 2) රතු

21)



22.නා 23.රතු 24.කජු 25.කෙසෙල් 26.වේයා

27.මී හරකා 28.වට්ටක්කා 29.වවුලා 30.සුදු

31.මීයා 32.වවුලා 33.බළලා 34.නරියා 35.කස්තුරි